# දැන්වීමයි

## ඉදිකිරීම් වැඩ සඳහා

## කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

2026/2027 විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙ සහ කැලණිය වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතනයේ ගොඩනැඟිලි, මාර්ග, උද්‍යාන, ජලනල පද්ධති, ජල අපවහන පද්ධති හා වෙනත් ඉදිකිරීම්, නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අදාළ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් නිකුත් කිරීම 2026.01.23 දින සිට 2026.02.09 දක්වා සිදු කරනු ලබයි.

ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන දිනයට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) වලංගු ලියාපදිංචිය සපුරා තිබිය යුතුය. එසේම සියලුම අයදුම්කරුවන් අදාළ ශ්‍රේණිවල නියමිත යාවත්කාලීන කිරීම ලියාපදිංචියට පෙර තහවුරු කළ යුතුය.

ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් මේ සඳහා වන අයදුම්පත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතුය. අයදුම්පත් නිකුත් කරන කාල සීමාව තුළ සතියේ රාජකාරි දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සරප් වෙත රුපියල් 500.00ක ආපසු නොගෙවන මුදලක් තැන්පත් කර පාලන අංශය වෙතින් අයදුම්පත ලබා ගත හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.02.12 දින ප.ව. 3.00ට හෝ ඊට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ 2026/2027 කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම ලෙස සටහන් කර, අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාළිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දිය යුතුයි.

අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10